Department of Education, Sabaragamuwa Province/ Weekly School Department of Education, Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, සබරගමුව - සති පාසල

ශ්‍රේණිය - 10

විෂය - ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

සතිය - 9-1

**නිපුණතාවය :- 5. මූලික පොත්වල ගනුදෙනු සටහන් කර ලෙජරය ට පිටපත් කරයි .**

**නිපුණතා මට්ටම :- 5.2.** බැංකු ගනුදෙනු බැංකු ගිණුමේ , බැංකු පොතේ වාර්තා කරයි .

**පාඩම–** 9.බැංකු ගිණුම සහ බැංකු සැසඳුම් විස්තරය

**ඉගෙනුම් පල –** *බැංකු ගිණුම හැදින්වීම, බැංකු ගිණුමේ ගනුදෙනු සටහන් කිරීමට අදාල මූලාශ්‍ර ලේඛන, බැංකු ගිණුමේ මුදල් සහ චෙක්පත් තැන්පත් කිරීම, චෙක්පත් අගරු වීම සටහන් කිරීම, බැංකු ගිණුම තුලනය කිරීම වාසිදායකශේෂයක් සහිතව*

**ශිෂ්‍යයා කළ යුතු කාර්යයන් –**

- ඔබගේ පෙළ පොතේ පිටු අංක 112 සිට 119 දක්වා හොඳින් කියවන්න.
- පහත සඳහන් ප්‍රශ්න සඳහා කෙටි හා නිශ්චිත පිළිතුරු සොයා ගැනීමට උනන්දු වන්න.
  01. බැංකු ජංගම ගිණුම කුමන ලෙජර ගිණුම් වර්ගයකට අයත් වේ ද ?
  02. බැංකු ජංගම ගිණුමේ ගනුදෙනු සටහන් කරනු ලබන්නේ කුමන ද්විත්ව සටහන් මූලධර්මයට අනුව ද?
  03. බැංකු ජංගම ගිණුමේ මුදල් තැන්පත් කිරීමට අදාල ද්විත්ව සටහන ලියන්න.
  04. බැංකු ජංගම ගිණුමේ මුදල් සහ චෙක්පත් තැන්පත් කිරීමේ දී අදාල කර ගන්නා මූලික ලියවිලි වෙන වෙනම නම් කරන්න.
  05. ව්‍යාපාරයට ලැබෙන චෙක්පත් බැංකු ජංගම ගිණුමේ තැන්පත් කිරීමට අදාල ද්විත්ව සටහන ලියන්න.
  06. චෙක්පත් මගින් ගෙවීම් කිරීමේ දී එයට අදාලව පිළියෙල කරනු ලබන මූලාශ්‍ර ලියවිල්ල නම් කරන්න .
  07. රවිඳු ගේ ව්‍යාපාරයේ 2021.මාර්තු මාසය සඳහා චෙක්පතකින් ගෙවන ලද සේවක වැටුප රු. 150,000 කි. මෙම ගනුදෙනුව ගිණුම් ගත කිරීමට අදාල ද්විත්ව සටහන ලියන්න .
  08. චෙක්පත් අගරු වීම යනු කුමක්ද ?
  09. චෙක්පත් අගරු වීමට බලපාන හේතු දෙකක් නම් කරන්න .
  10. චෙක්පත් අගරු වීම සටහන් කිරීමට අදාල කර ගන්නා මූලික ලියවිල්ල කුමක්ද ?
  11. අත්පිට විකුණුම් සඳහා ලැබී බැංකුවේ තැන්පත් කරන ලද රු.10,000 ක් චෙක්පත අගරු වූ බව බැංකුව විසින් දැනුම් දෙන ලදි. මෙම ගනුදෙනුව ගිණුම්ගත කිරීමට අදාල ද්විත්ව සටහන ලියන්න .
  12. ව්‍යාපාරය විසින් ප්‍රවාහන වියදම් සඳහා නිකුත් කරන ලද රු.25,000 ක් චෙක්පත අගරු වූ බව බැංකුව විසින් දැනුම් දී ඇත. මෙය සටහන් කිරීමට අදාල ද්විත්ව සටහන ලියන්න.

- ඔබගේ පෙලපොතේ පිටු අංක 119 හි සඳහන් ක්‍රියාකාරකම් 01 සඳහා පිළිතුරු සපයන්න.
- තවදුරටත් විෂය කරුණු අධ්‍යයනය සඳහා පහත යොමු සමග සම්බන්ද වන්න.

ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාර කරගත හැකි පොත් පත්, Website,LMS පාඩම් හා ඉගෙනුම් ආධාරක

I. e - තක්සලාව - බැංකු ගිණුම සහ බැංකු සැසඳුම් විස්තරය (moe.gov.lk)
II. e -නැණ පියස - 10 ව්‍යාපාර අධ්‍යයනය හා ගිණුම්කරණය: බැංකු ගිණුම සහ බැංකු සැසඳුම් විස්තරය (enenapiyasa.lk)
III. ගුරුගෙදර - නැත
IV. වෙනත් - utube -(846) OL Commerce|Grade 10 |Lesson 9-බැංකු ගිණුම සහ බැංකු සැසඳුම් විස්තරය (Bank Reconciliation Statements) - YouTube
V. අතිරේක කියවීම් පොත්/ සඟරා - පෙළපොත හොඳින් අධ්‍යනය කිරීම ප්‍රමාණවත් වේ.

ඔබේ දැනුම පිරික්සීමට මෙම යොමුව සමග සම්බන්ද වන්න.
Business _ Accounting Studies - Google Drive


සැකසුම - නම - .G.N.සදමාලි........ තනතුර - .ස අ අ...(වාණිජ).....

දෙහිඕවිට අධ්‍යාපන කලාපය